සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## සිංහල සාහිත්‍ය රසාස්වාදය

කාලය: පැය 03යි.

නම/විභාග අංකය :- ..............................................................

<u>සැලකිය යුතුයි.</u>

- I කොටසෙහි 01 , 02 ප්‍රශ්නවලටත් II කොටසෙහි 03 වැනි ප්‍රශ්නයටත් III කොටසෙහි 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

### I කොටස

- අංක (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ) , (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(01) (i) "මේ රාත්‍රියෙහි සැතපෙන තෙනක් දෙවු නම් තොපට වීණා ගායනා කෙරෙමි."

(අ) ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද?

(ආ) වීණා ගායනා කෙරෙමි'යි කීයේ කාට ද?

(ii) "කටුකනත්තෙ බෙබි කැපිල්ලට ගිහිං හිටියය කියල ආරංචියි."

(අ) මෙහි 'බෙබි කැපිල්ල' යනුවෙන් සඳහන් කර ඇත්තේ කුමක් ද?

(ආ) බෙබි කැපිල්ලට ගිහිං හිටියය කියන්නේ කවුරුන් ද?

(iii) දියනෙත උදාවන සිය කිරණින් **මහරු**
මෙදියත දිවා බිහි දුරු වෙයි ගන **අඳුරු**
සිරිමත රජතුමකු දුටු පමණින් **සොඳුරු**
ඇතුළත පිටත දිව රැ හැරෙය **දුක්'ඳුරු**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය දක්වන්න.

(ආ) මෙහි අවසන් පද්‍ය පාද දෙකෙහි අදහස ලියන්න.

(iv) "අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කුඩුවක් හදමු"

(අ) ඉහත උද්ධෘතය ඇතුළත් කෙටි කතාවේ කතුවරයා නම් කරන්න.

(ආ) මෙහි 'අපි' යනුවෙන් සඳහන් වන්නෝ කවුරුන් ද?

(v) ආගන්තුකව එන කෙනෙකුට පුරුදු **නැති**
හිතවත්කමින් සැලකූ යුතුකමය **නිති**
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය **තුති**
සිහි වී මගේ කම්මුල රතු පැහැය **ගති**

(අ) මෙම පද්‍ය ඇතුළත් පැදිපෙළ කාගේ නිර්මාණයක් ද?

(ආ) අවසන් පද්‍ය පාද දෙකෙන් ව්‍යංග්‍යාර්ථවත් ව කියැවෙන අදහස ලියන්න.

(ලකුණු 4 × 5 = 20)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

(02) දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

උපන්නොත් මැරෙන්නෙත් තතියමයි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

නම්බුව කැමති අය ඇති නම් නොවී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලොම් සිදුරක තරම්වත් අඬ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උපන් ගමේ බල උරුමය රැක ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසියන්ට
බියෙන් නොගොස් අහුමුලුවල රිංගන්ට
ඉතින් යමව් ගම්මුන්ට ම එක් වෙන්ට

වඳින්නේ නැතිව ලොකු නිලධාරින් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අතත් පයත් ඔළුවත් වෙන වෙන ම කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල්ල ම
අපේ අතට අවනත කරගෙන වහම
අපේ නමට සලකත දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමගි සැපා
සෙලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විශ්වාසය දෙන්ට එපා

(1) මෙම පද්‍ය පන්තියට කවියා යොදා ගෙන ඇති අත්දැකීම කුමක් ද? (ලකුණු 05)

(2) තම අත්දැකීම ප්‍රබල ව ඉදිරිපත් කිරීම සඳහා කවියා යොදා ගත් යෙදුම් දෙකක් උපුටා ලියන්න. (ලකුණු 05)

(3) තම අත්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීමට කවියා යොදා ගත් ආකෘතිය උචිත වන්නේ ද? (ලකුණු 05)

(4) කවියා සහෘදයාට දෙන උපදේශ දෙකක් උපුටා ලියන්න. (ලකුණු 05)

(5) පැදි පෙළ සඳහා කවියා උපයුක්ත කර ගත් බස්වහර රස නිෂ්පත්තිය සඳහා කොතෙක් දුරට ගැළපේ ද? (ලකුණු 05)

(මුළු ලකුණු 5 x 5 = 25)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

## II කොටස

- පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

(03) එසඳ මහා බෝධිසත්ත්වයෝ එසත් රජුන් අල්වා ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතල අයා බැඳගෙන ඒ රණ භූමියෙන් නොයෙක් ජයඝෝෂා පවත්වා ගෙන මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් දිවි දළන් ඔප් නගා කරන ලද ස්වර්ණ ප්‍රතිමාවක් මෙන් විරාජමාන ව අනන්‍ය සාධාරණ ශ්‍රී විභූතියෙන් යුක්ත ව සුරසෙන් පිරිවරා සුජාතාවන් හා ඓරාවණ වාහනාරූඪව අසුර විජය කොට අවුත් වෛජයන්ත ප්‍රාසාදයට වදනා ශක්‍ර දේවේන්ද්‍ර විලාසයෙන් මාළිගාවට වැද මද්‍ර රජ්ජුරුවන් දැක "මයිලණුවන් වහන්ස, තුඹ වහන්සේට විරුද්ධ ව අවුදින් නුවර වටලා ශත්‍රු සේනාව මර්ථනය කොට රජ දරුවන් සත් දෙනා ජීවග්‍රාහයෙන් අල්වා ගෙන ආමි.
මොවුන් මරතත් මැරුව මැනව, හරිතත් හළ මැනව, වහල් මේ ගනිතත් ගත මැනව. කැමැත්තක් කළ මැනවැ'යි කීහ.

(1) පාඨයේ සඳහන් ආකාරයට මහබෝධිසත්ත්වයන් රූපත් වූයේ කුමන බලයක් නිසා ද? (ලකුණු 05)

(2) පාඨයෙහි රූපත් වූ කුස කුමරුගේ භෝභාව වර්ණනා කර ඇත්තේ කෙසේ ද? (ලකුණු 05)

(3) පාඨයෙන් උපමා දෙකක් උපුටා ලියන්න. (ලකුණු 05)

(4) මද්‍ර රජු දුටු බෝසතුන් තමා අල්වාගෙන පැමිණි සත් රජුන් පිළිබඳව පැවසූ දෑ විස්තර කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

නැතහොත්

වැහි වලාකුළ පෑ කළු යැයි ඔබෙ
　　නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුර පැයෙනු'ගත් සුදනෝ ලොවේ
　　නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා

පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු - වැව් පොකුණුත් පුරවා දියෙන්,
　　ලොවට දෙන්නා ඔබයි අහරත් පැනුත්

නද අසා ඔබ ගේ පැහැයත් බලා,
　　මොනරු පිල් විදහා රඟ දෙත් නදින්,
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
　　තුරු ලියත් ලිය - ලයි සැනැසී දියෙන්,

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
　　ඉහළ යෙයි, ඔබ යෑම පහත් වැ මැ යි
ඒ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
　　ගුණ බරින් නැමුණෝ'වි පවතිත් නිතින්

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
　　කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
　　නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

ගුණ බලා ඔබගේ ලො සබා දහම්
'ඔබ' ය අන් කිසිවෙක් නිසි නෑ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
පළඳවන්නෙ ඔබෙ ගෙලෙ මැ යි බලන්

(1) පද්‍ය පන්තිය අනුව උතුමන් හඳුනාගන්නේ කෙසේ ද? (ලකුණු 05)

(2) පැදි පෙළ සඳහා කවියා යොදා ගෙන ඇති බස්වහර එහි සාර්ථකත්වය සඳහා බලපෑ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(3) වැහි වලාකුළේ අගනාකම් දෙකක් ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 05)

(4) සුලබ අත්දැකීමක් ඇසුරෙන් සුදන ගුණ අපූර්ව ආකාරයෙන් වර්ණනා කිරීමට කවියා පෑ සමත්කම කෙබඳුදැයි විමසන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

## III කොටස

- මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් උත්තරයක වචන 150ක් වත් තිබිය යුතු ය)

(04) ශිෂ්ට සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා සංයමයෙන් යුතුව උපදෙස් ලබාදීම සුභාෂිත කවියාගේ සුවිශේෂ ලක්ෂණයකි. සුදුසු උදාහරණ තුනක්වත් දක්වමින් අගයන්න. (ලකුණු 15)

(05) ළමා ලොව සිතුම් පැතුම් මැනවින් නිරූපණය කිරීම වෙසක් පහන කෙටි කතාවේ සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය නිදසුන් තුනක්වත් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(06) මිනිස් දුබලතා සංවාදශීලී ස්වරූපයෙන් ගෙනහැර පෑම ඇත්ගාලේ දරුපෙම පද්‍ය පන්තියේ අරමුණ වී ඇත. උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 15)

(07) උපායශීලී, බුද්ධිමත් මවක ලෙස සීලවතී බිසවගේ චරිතය නිරූපණය කර ඇත. කුස ජාතකයෙන් සුදුසු නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk